# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

## 2020 දෙසැම්බර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වර්ධනය විය.

**රටේ ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථාවත් වීම හේතුකොටගෙන නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව 2020 දෙසැම්බර් මාසයේ දී 61.2ක අගයක් වාර්තා කරමින් තවදුරටත් ඉහළ යන ලදී.** නිෂ්පාදනය, නව ඇණවුම්, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් උප දර්ශක වල දක්නට ලැබුණු ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ නිෂ්පාදනය සහ නව ඇණවුම් උප දර්ශක වල සිදුවූ සැලකිය යුතු වැඩි වීම සමස්ත දර්ශකයේ ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, 2020 දෙසැම්බර් මාසය තුළදී සේවා නියුක්තිය උප දර්ශකය ද ඉහළ ගොස් ඇත. ඉල්ලුම ඉහළ යාමත් සමගම කර්මාන්තශාලා මෙහෙයුම් කටයුතු වර්ධනය වීම හේතුවෙන් සේවා නියුක්තිකයින් වඩාත් ඵලදායීව සේවයේ යෙදවූ බව ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින් අවධාරණය කරන ලදී.

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **57.6** | **61.2** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 61.8 | 63.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 52.2 | 60.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 48.9 | 51.1 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 47.2 | 55.6 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 77.0 | 75.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදන වල සිදුවූ වර්ධනය මෙන්ම, එළඹෙන චීන නව අවුරුදු නිවාඩුව සමග ඇතිවිය හැකි සැපයුම් අවහිරතා සැලකිල්ලට ගනිමින් ඉදිරි නිෂ්පාදන අවශ්‍යතා සඳහා අවශ්‍ය තොග කල්තියා ඇණවුම් කිරීම හේතුවෙන් තොග මිලදී ගැනුම් ඉහළ වේගයකින් වර්ධනය විය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය 2020 දෙසැම්බර් මාසයේදී අඩු වේගයකින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් කොළඹ වරායේ අඛණ්ඩව පැවති ප්‍රමාදයන් හේතුවෙන් අවශ්‍ය භාණ්ඩ තොග ලඟාවීමේ/නිෂ්කාශනය කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් සිදුවූ බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී.


රට තුළ මෙන්ම ප්‍රධාන අපනයන වෙළඳපොළවල ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන්ගේ උප දර්ශකය තවදුරටත් ඉහළ ගොස් ඇත.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**61.2**

**2020 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.6ක ඉහළ යෑමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.1 කින් ඉහළ යමින් 2020 දෙසැම්බර් මාසයේදී 53.8ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2020 දෙසැම්බර් මාසයේදී එක්සත් රාජධානිය, යුරෝපා කලාපය, එක්සත් ජනපදය සහ ඉන්දියාවෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් වැඩි වේගයකින් ඉහළ ගිය අතර, චීනයේ එම දර්ශකය අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, COVID-19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය තව දුරටත් අඩු වේගයකින් පහළ යන ලදී

*මූලාශ්‍රය: මාකිට් 1 ආයතනය, 2021 ජනවාරි 15 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 දෙසැම්බර් මාසයේ දී 55.6ක් දක්වා ඉහළ යමින් වර්ධන කලාපයට නැවත පැමිණි අතර, පෙර මාස දෙකෙහි එය කඩඉම් මට්ටටම වන 50.0 සීමාවට පහළ අගයන් අඛණ්ඩව වාර්තා කරන ලදී.** 2020 නොවැම්බර් මාසයට සාපේක්ෂව නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, නිමකිරීමට නියමිත කාර්යයන් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි දක්නට ලැබුණු ඉහළ යෑම් මෙම වර්ධනය සඳහා දායක වූ අතර, එමගින් COVID-19 වසංගතයෙහි දෙවන රැල්ල හේතුවෙන් පසුබෑමකට ලක් වූ සේවා අංශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කෙරේ.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ රක්ෂණ උපඅංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමග සේවා අංශයේ නව ව්‍යාපාර 2020 දෙසැම්බර් මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

අඛණ්ඩව මාස දෙකක් පහළ යන ලද සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් 2020 දෙසැම්බර් මාසයේ දී ඉහළ ගියේය. නිවාඩු සමය තුළ දේශීය සංචාරකයන්ගේ පැමිණීම ඉහළ යෑම හේතුවෙන් නවාතැන් සහ ආහාරපාන සැපයීමේ උපඅංශයෙහි 2020 දෙසැම්බර් මාසයේ දී වර්ධනයක් දක්නට ලැබුණි. තවද, 2020 දෙසැම්බර් මාසය තුළ දී සංචරණ සීමා තරමක් දුරට ලිහිල් කිරීම හේතුවෙන් ප්‍රවාහන, සහ තොග සහ සිල්ලර වෙළඳාම යන උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ ගියේය. මීට අමතරව, 2020 දෙසැම්බර් මාසයේ දී මූල්‍ය සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා උපඅංශවල ක්‍රියාකාරකම්හි ද ඉහළ යෑමක් දක්නට ලැබුණි. එහෙත්, භාණ්ඩ ප්‍රවාහනයෙහි සහ ආනයන වෙළඳාමෙහි යෙදී සිටින ප්‍රතිචාර දක්වන්නන් ආනයන සීමා හේතුවෙන් මුහුණපා ඇති ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව සඳහන් කරන ලදී.

ව්‍යාපාර ක්‍රියාකාරකම්හි ඉහළ යෑම හේතුවෙන් ඇතැම් ආයතන නව බඳවාගැනීම් ඇරඹීමත් සමග සේවා නියුක්තියෙහි පහළ යෑම පාලනය වීමක් පෙන්නුම් කරමින් සේවා නියුක්ති උපදර්ශකය ඉහළ ගියේය.

පසුගිය මාසයට සාපේක්ෂව ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට සිදු වූ අවහිරතා අඩු මට්ටමක පැවති බව පෙන්නුම් කරමින් 2020 දෙසැම්බර් මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඩු වේගයකින් ඉහළ යන ලදී.

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **48.8** | **55.6** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 50.5 | 55.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 43.0 | 64.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 39.0 | 44.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 58.5 | 51.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 53.0 | 62.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


COVID-19 වසංගතයෙහි දෙවන රැල්ලෙහි බලපෑමට ලක් වූ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබඳව සේවා සපයන්නන්ගේ සුභවාදී අදහස් ඉහළ යෑම හේතුවෙන් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා 2020 දෙසැම්බර් මාසයේ දී සැලකියයුතු ලෙස ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**55.6**

**2020 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.8ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑම මන්දගාමී වීමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 නොවැම්බර් මාසයේ පැවති 52.2 සිට 2020 දෙසැම්බර් මාසයේ දී 51.8 දක්වා පහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 දෙසැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානය සහ එක්සත් රාජධානිය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 ජනවාරි 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.